# උත්ථාන සමයේ සයවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 16:11-15

**"පාවුලු කී කරුණු සිතට ගන්නා ලෙස**
**ස්වාමින් වහන්සේ ඇගේ සිත පැහැදූ සේක."**

එහෙයින් අපි ත්‍රෝවසයෙන් නැව් නැගී කෙලින්ම සමොත්‍රාසියට ද පසුවදා නෙයාපොලිසියට ද යාත්‍රා කර, එයින් මසිදෝනියේ දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරය වූ ද, රෝම ජනපදයක් වූ ද පිලිප්පියට අවුත් එහි කීප දවසක් නැවතී සිටියෙමු. සබත් දිනයේදී නුවර වාසලෙන් පිට යාච්ඤා ස්ථානයක් ඇතැයි අපට සිතුණු බැවින් අප පිටත්ව ගංතෙරකට ගොස් එහි රැස්ව සිටි ස්ත්‍රීන්ට කතා කළෙමු. ඔවුන් අතර ලිදියා නම් ස්ත්‍රියක් අපට සවන් දෙමින් සිටියා ය. ඈ තියාතිරා නුවරින් පැමිණි දම්පාට සායම් බඩු විකිණූ වෙළෙන්දියකි. දෙවියන් වහන්සේට නමස්කාර කළ ස්ත්‍රියකි. පාවුලු කී කරුණු සිතට ගන්නා ලෙස දෙවියන් වහන්සේ ඇගේ සිත පැහැදූ සේක. ඈ ද ඇගේ ගෙයි වැසියන් ද බෞතීස්ම ස්නාපනය ලැබූ පසු ඈ කතා කොට "මම සැබැවින්ම ස්වාමින් වහන්සේ අදහන කෙනෙකැයි ඔබ පිළිගන්නවා නම් මාගේ ගෙදරට අවුත් එහි නැවතුණ මැනැවැ" යි අපෙන් උදක්ම ඉල්ලා, අප කැමැති කරවා ගත්තාය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 149: 1-6, 9

පිළිතුර: සමිඳාණෝ සිය සෙනඟ කෙරෙහි ප්‍රසන්න වන සේක.

ගීය:

සමිඳුන් පසසන්න. සමිඳුන්ට නව ගීතිකාවක් ද සැදැහැවතුන්ගේ සභාවේ දී එතුමන්ගේ පැසසුම් ද ගායනා කරන්න.
තමන් මැවූ තැනැන්වහන්සේ කෙරෙහි ඉශ්‍රායෙල් ප්‍රීති වෙත්වා!
තමන්ගේ රජුන් කෙරෙහි සියොන්හි දරුවෝ ප්‍රීතිමත් වෙත්වා!

එතුමන්ගේ නාමයට රඟපාමින් පැසසුම් කරත්වා! රබන් ගසා වීණා වයා එතුමන්ට පසස් ගී ගයත්වා!
සමිඳාණෝ සිය සෙනඟ කෙරෙහි ප්‍රසන්න වන සේක. දීනයන් ජය සිරියෙන් සරසන සේක.

සැදැහැවත්හු මහිමයෙන් යුක්තව ප්‍රීති වෙත්වා! මුළු රැය එතුමන් නමදිමින් ප්‍රීතියෙන් ගායනා කරත්වා!
සිය මුවින් සමිඳුන්ට පැසසුම් කරත්වා! මේ ගෞරවය එතුමන්ගේ සියලු සැදැහැවතුන්ට ඇත්තේය. සමිඳුන්ට ප්‍රශංසා වේවා!

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත්,
තුන්වනදා මළවුන්ගෙන් නැගිටින්නටත්,
ඉක්බිති ස්වකීය තේජශ්‍රීයට පැමිණෙන්ටත් යුතුව තිබුණා යයි ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත්තේය."
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15:26–16: 4

**"සත්‍යතාවයේ ආත්මයාණෝ මා හට සාක්ෂි දරන්නාහ."**

"මා විසින් ඔබ වෙත එවා වදාරණ සහායදායකයාණන් එනම් පියාණන් වහන්සේ වෙතින් නික්මෙන සත්‍යතාවේ ආත්මයාණන් පැමිණි කල උන්වහන්සේ මා ගැන සාක්ෂි දරන සේක. තවද, මුල සිටම ඔබ මා සමඟ සිටි බැවින් ඔබත් සාක්ෂිකාරයෝ වන්නහු ය."

මේ දේවල් මා ඔබට කීවේ ඔබ අධෛර්යයට පත් නොවන පිණිස ය. ඔවුන් ධර්ම ශාලාවලින් ඔබ නෙරපා දමනු ඇත. එපමණක් නොව, ඔබව මරණයට පත් කරන අය එය තමන් විසින් දෙවියන් වහන්සේට කරන පූජාවකැයි සිතන කාලයක් පැමිණෙන්නේය. ඔවුන් මේ දේවල් කරන්නේ, ඔවුන් පියාණන් වහන්සේ ද මා ද නොහඳුනන බැවිනි. තවද මා මේ දේවල්

ඔබට කීවේ ඒවා ඉටු වන කාලය පැමිණි විට ඒවා ගැන මා කී බව ඔබට සිහිවන පිණිස ය.

සුවිශේෂ වාක්‍යය එසේය.